# Path to Success – Study Pack

## තෙවන පාසල් වාරය සඳහා ඉගෙනුම් අත්වැල

## බුද්ධ ධර්මය - 7 ශ්‍රේණිය



අධ්‍යාපන සංවර්ධන අංශය

කලාප අධ්‍යාපන කාර්යාලය - කැලණිය

## උපදේශනය හා අධීක්ෂණය

පී.ඩී.ඉරෝෂණී කේ. පරණාගම මිය

(කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ)

## මෙහෙයවීම හා සංවිධානය

එෆ්.එච්.ජේ.පී.සිල්වා මයා

(නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - සංවර්ධන)

## විෂය සම්බන්ධීකරණය

පූජ්‍ය දඹෝරේ පියරතන හිමි

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ආගම)

## සැකසුම

එස්.වී.ඒ. චතුරාණි සමරසිංහ මිය

බප/කැළ/ නායකකන්ද අගරදගුරු පිරිමි විද්‍යාලය

ජී.යූ.පී. පියසේකර මිය

බප/කැළ/ සිරි සිදුහත් ක.වි.

## 17 පාඩම

## වළකමු වරදින් උපමා කොට තමන්

දිනක් බුදු රජාණන් වහන්සේ කොසොල් ජනපදයේ චාරිකා කරන අතර එහි වේළුද්වාර ගමට වැඩම කළ සේක. එහිදී අත්තූපනයාක ධර්මය පිළිබඳව දේශනා කළ සූත්‍රය වේළුද්වාර සූත්‍රය නම්වේ.

තමන් උපමා කොට අනුන්ට හානියක් නොකිරීම සහ යහපතකම කිරීම මෙම සූත්‍රයෙහි ත්‍රිකොටි පාරිශුද්ධ කාය වාග් සමචාරයන් හෙවත් තමා උපමා කොට ගෙන අනුන් කෙරෙහි පිලිපැදීම අත්තූපනායන ධර්මය නම්වේ.

මෙසේ ප්‍රාණඝාතයෙන් වැළකීමට අදාළ ත්‍රිකොටික පාරිශුද්ධිය ඇති කර ගැනීම පිළිබඳව සලකා බලනු පෙනේ.

01. තමන් මරනවාට අකමැති නම් අන් අයද මැරෙන්නට අකමැති බව සිතා වැළකීම.

02. අනෙක් අයවද එයින් වැලැක්වීම.

03. පර පණ නැසීමෙන් වැළකීමේ යහපත ගැන සාකච්ඡා කිරීම.

මේ ආකාරයට මෙය පංචශීලයට අදාළ කර ගත හැකිය.

ප්‍රාණඝාතයෙන් වැළකීම පිළිබඳව, සබ්බේ තසන්ති දණ්ඩස්ස ගාථාවෙන් ද පැහැදිලි වෙයි. මෙම අත්තූපනායික ධර්ම පර්යාය අත්තාධිපති ලෝකාධිපති, ධම්මාධිපති අනුව ද දක්වා තිබේ.

පාපයෙන් වැලකී කුසලයෙහි සිත පිහිටුවා බ්‍රහ්මක්‍රියාවෙහි නිරත වීම අත්තාධිපති නම්වේ. ආත්ම දමනයෙන් යුක්තිව පැවිදිව විමුක්තියට අරමුණු කර ගනිමින් සිටීම ලෝකාධිපති නම් වේ. වීර්යය වඩාගෙන සිත හික්මවාගෙන අකුලින් දුරුව කුසලයෙන් යෙදී විමුක්තිය ලදවි යැයි සිතා කටයුතු කිරීම ධම්මාධිපති නම් වේ.

පැවරුම්:

01. බුදු රදුන් වේළුද්වාර සූත්‍රය දේශනා කලේ කාටද?

02. එහිදී දේශනා කළ ධර්ම කරුණු පිළිබඳව කෙටි විස්තරයක් කරන්න.

03. පංචශීලයට ත්‍රිකෝටික පාරිශුද්ධිය ඇති කරගත යුතු ආකාරය පහදා දෙන්න.

04. සබ්බේ තසන්ති දණ්ඩස්ස ගාථාව සම්පූර්ණ කර තේරුම ලියන්න.

05. ඔබේ යහළුවෙකු අසරණ සතෙකුට හිංසා කරනවා ඔබ දුටුවා යැයි සිතන්න. එවිට ඔබ එම යහළුවාට නමක් කියන්නේද? (පාඩමට ඇතුව විස්තර කරන්න. )

## 18 පාඩම

## නෑකම ගැලපෙන ලෙසින් හැසිරෙමු.

අඟු රට චම්පා නුවර විසූ ඉතා ධනවත් උගත් සෝණ දණ්ඩ බමුණා විසින් බුදු රජාණන් වහන්සේගේ ගුණාංග පිළිබඳව කරන විස්තරයක් මෙම පාඩමෙන් දැක්වෙයි. ඒ අනුව සුභාෂණ, කථාවෙහි දක්ෂ, ක්‍රියාශීලි වීම, කාරුණික බව මෙහිදී පෙන්වා දෙයි. සුභාෂිත යනු ඇත්ත කථා කිරීම හා සමගි වන ලෙස කථා කිරීමයි.

මජ්ඣිම නිකායේ අභය රාජ සූත්‍රයේ අප කථා කරන වචන වල ඇතුළත් විය යුතු ප්‍රධාන කරුණු 3ක් පිළිබඳව පෙන්වා දෙයි.

01. කථා කරන විට සත්‍ය කරුණු වීම.

02. හේතු සාධක සහිත වීම.

03. අසන්නාගෙත් කියන්නාගෙත් යහපත පිණිස විය යුතු බව.

එසේම විහාරස්ථානයකදී හැසිරිය යුතු ආකාරය ශාසනික වචන පිළිබඳව ද මෙහිදී සාකච්ඡා කර ඇත.

පැවරුම් :

01. පන්සලකට ගිය විට හැසිරිය යුතු ආකාරය පෙන්වා දෙන්න.

02. ඔබ දන්නා ශාසනික වචන ලියා දක්වන්න.

03. අභය රජ සූත්‍රයට අනුව නරක හා කේලම් තියෙන ඔබේ යහළුවාට ඔබට කියා දිය හැකි පාඩම් මොනවාද?

## 19 පාඩම

## මහින්දාගමනයෙන් අප ලද දායාද

මහින්දාගමනයත් සමග ලක්දිව මහත් ශාසනික සංස්කෘතික සමාජයීය ප්‍රබෝධයක් ඇති වූ බව නොරහසකි. ශ්‍රී ලාංකීය භික්ෂු- භික්ෂුනි සසුන, ත්‍රිපිටකය, සර්වඥධාතු යන සියල්ලම අපට ලැබුණේ මහින්දාගමනය නිසාය. එසේම ඒ හරහා සංඝමිත්තා තෙරණිය ජයශ්‍රී මහා බෝධිය මෙරටට වැඩම කරවීම වැදගත් සිදුවීමකි. ඒ පැමිණෙන විට කුල 18ක පිරිස්ද ලක්දිවයිනට පැමිණීම විශේෂ වෙයි.

ත්‍රිවිධ චෛත්‍යය මුල් කර ගනිමින් ගෘහ නිර්මාණ ශිල්පය පුද පූජා ක්‍රම, ලේඛන කලාව පමණක් නොව කැටයම්, මූර්ති, ප්‍රතිමා නිර්මාණයද සිදුවිය. එපමණක් නොව වෙසක් පොහොය, වප් මගුල් වැනි උත්සව මෙන්ම පෙරහැර වන්දනා ආදිය දක්වාම එය විහිදුනි.

පැවරුම්:

01. ගෘහ නිර්මාණ ශිල්පය ත්‍රිවිධ චෛත්‍යය හරහා ඇති වූ ආකාරයට නිදසුන් දෙන්න.

02. බෞද්ධයන් විසින් කරනු ලබන උත්සව නම් කරන්න.

03. ලේඛන කලාව දියුණු වූ ආකාරය විස්තර කරන්න.

04. ඔබ දන්නා පුද පූජා ක්‍රම පිළිබඳව ලියන්න.

05. ඔබේ පාසලේ මුස්ලිම් යහළුවාට විහාරස්ථානයේ චාරිත්‍ර හා ඒ හා බැදුණු අංග පිළිබඳව කරන විස්තරයක් කරන්න.

## 20 පාඩම

## ධන පරිහරණයට අදාල බොදු මග

ධනය මෙන්ම අප සතු දේවල් අරපරිස්සමෙන් පරිහරණය කළ යුතු ආකාරය මෙහිදී පෙන්වා දෙයි. ඔබ භාවිතා කර අයින් කරන වස්ත්‍ර, කෑම බීම කෙතරම් අපතේ යනවාද? ඒවා තවදුරටත් ප්‍රයෝජනයට ගත හැකි ආකාරය මෙහිදී පෙන්වා දෙයි. අනඳ හිමි බුද්ධ පුත්‍රයන් සිවුරු භාවිතා කරන ආකාරය උදේනි රජුට පෙන්වා දීම මේ පාඩමේ පෙන්වා දෙයි. ආත්මාර්ථකාමී නොවී සියළුම දේ තමාට අයත් කර ගන්නේ නැතිව බෙදා හදා ගැනීම හොඳ බෞද්ධ දරුවෙතුගේ ලක්ෂණයකි. උපයන සියල්ලම වියදම් කොට දුක් විදිනන් හෙවත් උදුම්බරවාදිතයි නොවීම මෙන්ම නොකා නොබී ධනය රැස් කර ගන්නා (අජද්ධාමාරිකයන්) ද බුදු දහම ප්‍රතික්ෂේප කරයි. සමජීවිතතාවයෙන් හෙවත් තුලාධෘරිත පුද්ගලයෙන් වැදගත්කම මේ පාඩමෙන් විස්තර කරයි.

පැවරුම:

01. සිඟාලෝවද සූත්‍රයේ සඳහන් ධනය බෙදෙන ප්‍රධාන කොටස් මොනවාද?

02. තුලාධාරිත පුද්ගලයෙන් වීමේ වැදගත්කම පෙන්වා දෙන්න.

## 21 පාඩම

## දෙලෝ වැඩ සාදන  පින් කිරියාවත්

කාව්‍යශේඛරය රචනා කළේ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසිනි. මෙය රචනා කළේ කෝට්ටේ යුගයේදීය. ඒෂ  වන පැරකුම් රජුගේ දියණිය වන උලකුඩය දේවියගේ ආරාධනයෙන් මේ මහා කවි පොත රචනා කර ඇතැයි සැලකේ. ජාතක පොතේ සත්තුභත්ත ජාතකය ඇසුරින් මෙය රචනා කර ඇත. මෙම කවිපොතේ දොළොස් පින් ක්‍රියා පිළිබඳව උගන්වා තිබේ. පුණ්‍ය ක්‍රියා කොටස් 3කට දැක්විය හැකිය.

01. ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා

02. දස පුණ්‍ය ක්‍රියා

03. දොළොස් පුණ්‍ය ක්‍රියා

පුණ්‍ය ක්‍රියා යනු දාන, සීල ආදි සසර යහපතට වන ක්‍රියාවන්වේ. සසර සැප නැමැත්තන් විසින් නැවත පින් කළ යුතුවේ. එවැනි ක්‍රියා 10 කි.

01. දන්දීම

02. සිල් රැකීම

03. භාවනා කිරීම

04. පින්දීම

05. පින් අනුමෝදන් වීම

06. වතාවත් කිරීම

07. වැඩිහිටියන්ට ගරු බුහුමන් කිරීම

08. ධර්ම දේශනා කිරීම

09. ධර්ම ශ්‍රවණය කිරීම

10. ශ්‍රද්ධාව හා අවබෝධය වැඩෙන ක්‍රියාවල

පැවරුම්:

01. දස පුණ්‍ය ක්‍රියා නම් කරන්න.

02. කාව්‍යශේඛරය රචනා කලේ කවුද?

03. කාව්‍යශේඛරයේ සඳහන් දොළොස් පුණ්‍ය ක්‍රියා කවරේද?

04. කාව්‍යශේඛරයේ සඳහන් කවි ඇසුරින් ඒවා විස්තර කරන්න.